# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## අධ්‍යක්ෂ - බලපත්‍ර කළමනාකරණ තනතුරට බඳවා ගැනීම (බාහිර)

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩුව ස්ථිර පදනම මත පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**(1) රැකියා විස්තරය**

01 නව බලපත්‍ර සහ බලපත්‍ර අලුත් කිරීම් පිළිබඳ අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම - ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය.

02 පවතින බලපත්‍රවල කොන්දේසි පිළිබඳ සංශෝධන සම්පාදනය කිරීම - ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 18 වන වගන්තිය.

03 උපකරණ ආනයනය සහ නිෂ්කාශනය සඳහා අවසර ලබා දීම.

04 බලපත්‍ර කොන්දේසි බලාත්මක කිරීම.

05 බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරන සේවා සපයන්නන්ගේ තාක්ෂණික කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

විදුලි හෝ ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ හෝ තොරතුරු තාක්ෂණ විෂයයකින් පළමු හෝ දෙවන පන්තියේ ගෞරව උපාධිය සහ පශ්චාත් උපාධිය සමඟ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්ද සහ එයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම .

හෝ

විදුලි හෝ ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ හෝ තොරතුරු තාක්ෂණ විෂයයකින් පළමු හෝ දෙවන පන්තියේ ගෞරව උපාධිය සමඟ එම ක්ෂේත්‍රයක වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය සහිතව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්ද සහ එයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම .

හෝ

විදුලි හෝ ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ හෝ තොරතුරු තාක්ෂණ විෂයයකින් උපාධිය සහ පශ්චාත් උපාධිය සහිත දිප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

හෝ

විදුලි හෝ ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ හෝ තොරතුරු තාක්ෂණ විෂයයකින් උපාධිය සහ එම ක්ෂේත්‍රයක වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය සහිත දිප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

**(4) වැටුප :-** TRC 1.3 -Rs. 156,400 (10x6256) -(10x7038) – 289,340

**(5) වයස :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 24-55 විය යුතුය.

**(6) අයදුම් කිරීමේ ක්‍රමය**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk. වෙතින් බාගත කර ගත හැකිය.
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2025.04.29 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **අධ්‍යක්ෂ / බලපත්‍ර කළමනාකරණ තනතුර සඳහා අයදුම්පත** යනුවෙන් සඳහන් කළ යුතුය.
6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lk විද්‍යුත් තැපෑලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව " **අධ්‍යක්ෂ / බලපත්‍ර කළමණාකරන තනතුරට බඳවා ගැනීම - 2025** " විය යුතුය.
7. රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්පත් **2025.04. 29 දින හෝ එදිනට පෙර** ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

**(7) පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක 276
ඇල්විටිගල මාවත
කොළඹ 08